ආරෙ පළාත්

සැ.යු. :– 94.12.09 දින අංක 849 දරන ගැසට් පත්‍රයේ III වැනි කොටස හා IV (අ) වැනි කොටස පළ නොකරන ලදී.

(171)

පළාත් සභාව ... 18 - 1 - 1995 ... ලේකම් කාර්යාලය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 850 – 1994 දෙසැම්බර් 16 වැනි සිකුරාදා – 1994.12.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස–පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | — | තනතුරු – ඇබෑර්තු ... ... | – |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | – |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | – |
| පළාත් සභා නිවේදන ... ... ... | 1224 | බඩුබාහිරාදිය විකිණීම් ... ... | – |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | — | තොටුපල්, බලපත්‍ර හා වෙනත් බලපත්‍ර විකිණීම් ... | – |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | – |


**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාද දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාද දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව– එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1994 දෙසැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1994 දෙසැම්බර් මස 09 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1994 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

1223 - 76790 - 22,075 (94/12)

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 1994 අංක 07 දරන පෙර පාසල් ප්‍රඥප්තිය

සභාසම්මත කරගත් තිබේ - 1994 නොවැම්බර් මස 10 වැනි දින.

අනුමැතිය ලැබුණේ - 1994 නොවැම්බර් මස 22 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. යූ. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

## සබරගමුව පළාත් සභාව

### පෙර පාසල් පිළිබඳ ප්‍රඥප්තිය

**සබරගමුව පළාත තුළ පූර්ව පාසල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය හා සංවිධානකරණය විධිමත් කිරීමත්, එකී පාසල් සඳහා අවශ්‍ය කෙසීක හා මානව සම්පත් සැපයීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා සකස් කළ ප්‍රඥප්තියකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය සහ ක්‍රියාත්මක වන දිනය. 1. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 1994 අංක 07 දරන පෙර පාසල් පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රඥප්තිය ක්‍රියාවලිය. 2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර වන්නේය. තව ද මෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පවරනු ලැබිය හැක.

පෙර පාසල් ලියාපදිංචිය. 3 (අ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමක දින සිට දින 60ක කාලයක් ඇතුළත පළාත තුළ පවත්වාගෙන යනු ලබන සියලුම පෙර පාසල් පළාත් සභාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ යටතේ ලියාපදිංචි කළ යුතුය.

(ආ) නියමිත දිනයට පසු පළාත තුළ පෙර පාසලක් ආරම්භ කිරීමට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අවසරය ලබා ගත යුතුය.

පෙර පාසල් ගුරුවරුන් ලියාපදිංචි කිරීම. 4 (අ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක දින සිට දින හැටක කාලයක් ඇතුළත මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනය වන විට පෙර පාසල්වල සේවය කරන සියලුම ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ යටතේ ලියාපදිංචි විය යුතුය.

එසේ ලියාපදිංචි කිරීමේ දී –

(i) පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ලබා ඇති පුහුණුව ;
(ii) පළපුරුද්ද ;
(iii) වෙනත් විශේෂ හැකියාවන්.

සැලකිල්ලට ගත යුතුය.

(ආ) නියමිත දිනෙන් පසු පෙර පාසල් පුහුණුව ලබන යම් පුද්ගලයකු පෙර පාසලක සේවය කිරීමට පෙර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි විය යුතුය.

උපදේශක මණ්ඩලය. 5. පළාත තුළ පෙර පාසල් අධ්‍යාපන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා උපදෙස් දීම පිණිස සත් දෙනෙකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

5.1 මෙම උපදේශක මණ්ඩලය පහත දැක්වෙන අයගෙන් සමන්විත විය යුතුය :—

(1) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් - සභාපති ;
(2) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - සාමාජික ;
(3) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ විශේෂඥයින් දෙදෙනෙක් ;
(4) පළාත් පාලන අමාත්‍යවරයා විසින් නම් කළ නියෝජිතයෙක් ,
(5) ප්‍රධාන අමාත්‍යතුමා විසින් නැගෙනහිර ජනතාවගේ දියුණුව සඳහා ක්‍රියාකාරී නම් කරන ලද අදාළ විෂය ප්‍රජාමූලික ප්‍රවීණයන් හා උපදේශකයින් ඇති දෙදෙනෙක්.

6. පෙර පාසල් උපදේශක මණ්ඩලය මතු දැක්වෙන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය :— උපදේශක මණ්ඩලයේ කාර්යයන්.

(1) පෙර පාසල් ගුරු පුහුණු කිරීම ;
(2) පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උචිත පාඨමාලා ගුරුවරුන් සඳහා සකස් කිරීම ;
(3) පුහුණු කාල සීමාවන් නිර්ණය කිරීම ;
(4) පළාත් සභාව අනුමත කරන සැලැස්මක් යටතේ නියමිත ප්‍රමිතීන්ට අදාළව පෙර පාසල් පැවැත්වීම පිළිබඳව අධීක්ෂණය ;
(5) පළාත තුළ පෙර පාසල් ව්‍යාප්ත කිරීම සඳහා පළාත් පාලන ආයතන සමූපකාර සමිති සහ වෙනත් ස්වේච්ඡා සංවිධාන උනන්දු කිරීමට යෝග්‍ය වැඩ පිළිවෙලවල් සකස් කිරීම;
(6) පළාත් සභාව මගින් ආදර්ශ පෙර පාසල් ආරම්භ කිරීම ;
(7) දරුවන් තුළ යහපත් හැසිරීම් රටාවක් හා ගුණධර්ම වර්ධනයටත්, ජාතික සමගියටත් අදාළ වැඩ පිළිවෙලවල් සකස් කිරීම ;
(8) පෙර පාසල් දරුවන්ට දිවා ආහාර පහසුකම්, නිල ඇඳුම්, දරුවන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ වැඩ පිළිවෙල සකස් කිරීම සහ පෙර පාසල් ගුරුවරුන් සඳහා වැටුප් ලබා දීම.

7. (අ) පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි පෙර පාසල්වල කටයුතු ක්‍රමවත් කිරීමට යම් කාලසීමාවක් අධ්‍යාපන අමාත්‍යවරයාට, අදාළ ආයතනයේ හෝ සංවිධානයේ පාලක පාලිකාවන් හෝ ගුරුවරුන් වෙත නියම කළ හැක. ප්‍රමිතීන්ට පටහැනි පෙර පාසල්.

(ආ) නියමිත කාල සීමාව තුළ නිසියාකාරව කටයුතු නොකරන පෙර පාසල්වල ලියාපදිංචිය පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයාට අවලංගු කළ හැකිය.

8. පළාත තුළ පෙර පාසල් ආරම්භ කිරීමට, ව්‍යාප්ත කිරීමට හා පවත්වාගෙන යාම සඳහාත් පළාත් සභාව විසින් මූල්‍යමය හා ද්‍රව්‍යාධාර සපයා දිය හැකිය. පහසුකම් සැපයීම.

9. පෙර පාසල්වල දියුණුව අරභයා තත්කාලීන දරුවන්ගේ මව්පියන්, වැඩිහිටියන් හෝ භාරකරුවන් පෙර පාසලෙහි කලින් සිටි දරුවන්ගේ මව්පියන්, වැඩිහිටියන් හෝ භාරකරුවන් හා සුභ පතන්නන්ගෙන් ද සමන්විත සංවර්ධන මණ්ඩලය බැගින් සෑම පෙර පාසලක් සඳහාම වාර්ෂිකව තෝරා පත්කර ගත යුතුය. පෙර පාසල් සංවර්ධන මණ්ඩල.

10. මෙම ප්‍රඥප්තියේ 3(අ) වැනි වගන්තිය යටතේ පෙර පාසල් ලියාපදිංචි කිරීමේ අයදුම්පතක් හෝ 4 වැනි වගන්තිය යටතේ පෙර පාසල් ගුරුවරයෙක් වශයෙන් ලියාපදිංචි වීමේ අයදුම්පතක් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් එයින් අතෘප්තියට පත්වන සංවිධානයකට හෝ පුද්ගලයකුට පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකිය. අභියාචනා.

11. විෂය භාර අමාත්‍යවරයාට මෙම ප්‍රඥප්තියේ අන්තර්ගත බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය වන නියෝග පළාත් සභාවේ අනුමැතියෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින හෝ නියෝගයෙහි සඳහන් යම් දිනයක හෝ සිට ක්‍රියාත්මක වන්නේය. නියෝග.

12. ස්වේච්ඡා සංවිධාන .– 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනත යටතේ හෝ පළාත් සභාව මගින් පනවනු ලබන ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි සංවිධාන ඇතුළත් වේ. අර්ථ නිරූපණ.

13. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

උතුරු නැගෙනහිර පළාත් සභාව

නගර සභා ආඥාපනත (255 වැනි අධිකාරය)

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු (255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 193(2) (ඊ) වැනි වගන්තිය යටතේ කියවිය යුතු 159(1)(ඊඊ) වැනි වගන්තිය යටතේ උතුරු නැගෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාරවරයා විසින් සාදන ලද රීති.

ලයනල් ප්‍රනාන්දු,
උතුරු නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවර.

1994 අගෝස්තු මස 23 වැනි දින,
ගරු ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

රීති

(1) මේ රීති 1993 උතුරු නැගෙනහිර පළාතේ නගර සභා (මන්ත්‍රීවරුන්ගේ දීමනා) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) උතුරු නැගෙනහිර පළාතේ නගර සභාවල සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට 1993 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවනු ලබන මාසික දීමනා පහත සඳහන් උපලේඛනයේ යටත්ව සභාව තීරණය කරන සීමාවන්ට අනුව විය යුතුයි .-

| | 93.01.01 වැනි දින සිට 93.06.30 වැනි දින දක්වා රු. | 93.07.01 වැනි දින සිට රු. | 93.01.01 වැනි දින සිට 93.12.31 වැනි දින දක්වා රු. | 94.01.01 වැනි දින සිට රු. |
|---|---|---|---|---|
| (අ) සභාපතිවරයෙකුට | – | | 4,700 | 5,400 (සංග්‍රහ දීමනා ඇතුළුව) |
| (ආ) උප සභාපතිවරයෙකුට | 2,465 | 2,775 | – | – |
| (ඇ) මන්ත්‍රීවරයෙකුට | 1,857 | 2,095 | – | – |

12-388

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.